**SAVINGS**

AIA SAVINGS PLAN

# ඔබේ සිහින සැබෑ කරන ඉතුරුම් සැලසුම



aialife.com.lk

HEALTHIER, LONGER, BETTER LIVES

අප සියලු දෙනා සතු සිහින හා අපේක්ෂාවන් රාශියකි. එම සිහින සැබෑ කරගැනීම සඳහා අපි බැංකු ඉතුරුම් ගිණුම්, ස්ථාවර තැන්පතු වැනි සාම්ප්‍රදායික ඉතුරුම් ක්‍රම අනුගමනය කිරීම සාමාන්‍ය සිරිතයි. කෙසේවුවත්, ඉහත ඉතුරුම් ක්‍රම මගින් ඇතැම්විට අප බලාපොරොත්තු වූ ඉපැයීම් එලෙසින්ම හිමි නොවීමටද ඉඩ ඇත. එමනිසා අප ඔබ වෙත ඉදිරිපත් කරන්නේ එක් ඉතුරුම් ක්‍රමයකට සීමා නොවී, භාණ්ඩාගාර බිල්පත්, කොටස් වෙළඳපොළ ආයෝජන වැනි බොහෝ ආයෝජන අවස්ථාවන් සහිත, AIA SavingsPlan.

AIA SavingsPlan මගින් ඔබට වඩාත්ම ගැළපෙන ආයෝජන ක්‍රමවේදයක් තෝරාගැනීමේ අවස්ථාව හිමි වේ. එමගින් ඔබේ ආයෝජනයට උපරිම ප්‍රතිලාභ හිමිකර ගැනීමේ අවස්ථාව ඔබ සතුය. එපමණක් නොව දැන් ඔබට හා ඔබේ ආදරණීයයන් වෙත රක්‍ෂණ ප්‍රතිලාභ රැසක් ද මෙමගින් ලබාදේ.

සැබවින්ම AIA SavingsPlan වෙතින් දැන් ඔබට ජීවිත රක්‍ෂණයේත් ආයෝජනයේත් කදිම සංකලනයක්.

# AIA SavingsPlan හි විශේෂත්වයන්

- Cautious, Moderate, Aggressive සහ Advanced යන ආයෝජන ක්‍රමවේදයන් මගින් ඔබේ ඉතුරුම් අරමුදල ගොඩනැගීමට කොටස් වෙළඳපොළ සිට භාණ්ඩාගාර බිල්පත් දක්වා වූ ආයෝජන අවස්ථාවන්.
- තෙවන සැලසුම් වසර ආරම්භයේ සිට සෑම වසරකම, අදාළ සැලසුම් වසර ආරම්භයෙහි පවතින අරමුදලේ වටිනාකමින් 10% ක උපරිමයක් දක්වා මුදල් ආපසු ලබා ගැනීමේ අවස්ථාව.
- කල්පිරීමේදී බදු වලින් නිදහස් ඉතුරුම් අරමුදලක්.
- ඔබටම ගැළපෙන ජීවිතාවරණයක්.
- ඔබගේ පවුලේ මාසික ආදායම සුරක්ෂිත කිරීමේ හැකියාව.
- ඔබේ ඉතුරුම්, උද්ධමනයේ අහිතකර බලපෑමෙන් සුරක්ෂිත කිරීමේ හැකියාව.
- අමතර වාරික (Top-ups) මගින් ඔබේ ඉතුරුම් අරමුදල තවදුරටත් වැඩිකර ගැනීමේ අවස්ථාව.
- ඔබව, ඔබගේ කලත්‍රයා හා ඔබගේ දරුවන් සුරක්ෂිත කිරීම සඳහා අතිරේක ප්‍රතිලාභ රැසක්.
- අමතර සෞඛ්‍ය සහ රැකවරණ ප්‍රතිලාභයන් මගින් බරපතල රෝගාබාධ, රෝහල්ගතවීම් සහ සැත්කම් ද ආවරණය වේ.

## ඔබේ ඉතුරුම් අරමුදල ගොඩනැගීමට ආයෝජන අවස්ථා රැසක්

සැලසුම ආරම්භයේදී පහත සඳහන් ආයෝජන ක්‍රමවේදයන් අතරින් එකක් තෝරාගැනීමේ අවස්ථාව ඔබ වෙත හිමිවේ.

| ආයෝජන ක්‍රමවේදය | Growth අරමුදලේ ආයෝජනය වන කාලය (වාරික ගෙවන කාල සීමාවේ ප්‍රතිශතයක් ලෙස) | Balanced අරමුදලේ ආයෝජනය වන කාලය (වාරික ගෙවන කාල සීමාවේ ප්‍රතිශතයක් ලෙස) | Secure අරමුදලේ ආයෝජනය වන කාලය (වාරික ගෙවන කාල සීමාවේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|
| Cautious | 25% | 55% | 20% |
| Moderate | 40% | 40% | 20% |
| Aggressive | 65% | 20% | 15% |
| Advanced | ආයෝජනයේ තීරණ ඔබ අතේ. | | |

Cautious, Moderate සහ Aggressive යන ආයෝජන ක්‍රමවේදයන්ගෙන් එකක් ඔබ තෝරා ගත්තේනම්, ඔබේ වාරික/අරමුදල ඉහත වගුවේ සඳහන් කාලසීමාවන්ට අනුකූලව Secure, Balanced, Growth යන අරමුදල්හි ආයෝජනය කෙරෙනු ඇත.

උදාහරණය: ඔබේ සැලසුමේ කාලසීමාව වසර 20 ක්නම් හා ඔබ Aggressive ක්‍රමවේදය තෝරාගනු ලැබුවේනම්, පළමු වසර 13 තුළ Growth අරමුදලෙහිද ඊළඟ වසර 4 තුළ Balanced අරමුදලෙහිද අවසන් වසර 3 තුළදී Secure අරමුදලෙහිද ඔබගේ වාරික/අරමුදල ආයෝජනය කෙරෙනු ඇත.

ඔබ තෝරාගත් ආයෝජන ක්‍රමවේදය සැලසුම් වසරකට උපරිම වශයෙන් දෙවතාවක්, වෙනස් කිරීමේ නම්‍යශීලීත්වය ඔබ සතු වේ.

Cautious, Moderate සහ Aggressive යන ආයෝජන ක්‍රමවේදයන් ඉදිරිපත් කර ඇත්තේ ඔබේ සැලසුමේ කාලසීමාව හා ආයෝජන අවදානමට මුහුණදීමේ හැකියාව අනුව, ඔබේ අරමුදල් ආයෝජන කරනු ලබන්නේ කවරාකාරයෙන් ද යන්න තීරණය කිරීමට පහසුවන අයුරිනි.

ඔබට, ඔබගේ අරමුදල් සංකලනය පිළිබඳව තීරණය කරමින්, ඔබගේම ආයෝජන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අවශ්‍යනම් Advanced ආයෝජන ක්‍රමවේදය තෝරාගත හැක. එහිදී ඔබ හට, ඔබගේ වාරිකයන් ආයෝජනය කෙරෙන ආකාරය හා අවැසි විට Secure, Balanced, Growth යන ආයෝජන අරමුදල් තුන අතර ඔබගේ ගොඩනැගුනු අරමුදල් එක් 'ආයෝජන අරමුදලකින්' තවත් 'ආයෝජන අරමුදලකට' මාරු කිරීමේ හැකියාව හිමිවේ.

## ආයෝජන අරමුදල්

| Secure අරමුදල | Balanced අරමුදල | Growth අරමුදල |
|---|---|---|
| වාරිකයෙන් වැඩි කොටසක් ණය සුරැකුම්පත් තුළ ආයෝජනය කෙරෙන අතර සුළු කොටසක් කොටස් වෙළඳපොළේ ආයෝජනය කෙරේ. මේ නිසා ක්‍රමානුකූලව වර්ධනය වන ඉපැයීමක් අපේක්ෂිතයි. | ණය සුරැකුම්පත් තුළ හා කොටස් වෙළඳපොළේ තුලනාත්මකව ආයෝජනය කෙරේ. මෙහිදී ඉපැයීම හා අවදානම අතර සමබරතාවය පවත්වාගෙන යන පරිදි ආයෝජනයන් සිදුකෙරේ. | කොටස් වෙළඳපොළේ වැඩි කොටසක් ආයෝජනය කෙරෙන බැවින් වැඩි වර්ධනයක් අපේක්ෂිතයි. කොටස් වෙළඳපොළ ආයෝජනයන්ට ආවේණික අවදානම ඉහළ ලෙස සැලකේ. |
| | සංයුතිය | |
| ණය සුරැකුම්පත් 40% - 100%<br>කොටස් වෙළඳපොළ: 0 - 20%<br>මූල්‍ය වෙළඳපොළ සහ මුදල්: 0 - 40% | ණය සුරැකුම්පත් 10% - 90%<br>කොටස් වෙළඳපොළ: 10% - 60%<br>මූල්‍ය වෙළඳපොළ සහ මුදල්: 0 - 30% | ණය සුරැකුම්පත් 0 - 50%<br>කොටස් වෙළඳපොළ: 20% - 100%<br>මූල්‍ය වෙළඳපොළ සහ මුදල්: 0 - 30% |

## ඒකක මිලෙහි වර්ධනය*

| අරමුදල | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|
| Secure | 14% | 6% | 9% | 11% | 8% | 6% |
| Balanced | 46% | -4% | 8% | 10% | 12% | 2% |
| Growth | 86% | -12% | 6% | 7% | 18% | -4% |

* අතීතයේ ලබාදුන් ඉපැයීම් අනාගත ඉපැයීම් සඳහා සහතිකයක් නොවේ.

## ඔබගේ ඉතුරුම් අරමුදල ගොඩනැගෙන ආකාරය

2016 දී ඔබේ වයස අවුරුදු 30 ක්නම්, වසර 15 ක සැලසුමක් තෝරාගත්තේනම්, ඔබේ ඉතුරුම් අරමුදලේ ප්‍රක්ෂේපිත වටිනාකම් පහත පරිදි වනු ඇත.

| වාර්ෂික මූලික වාරිකය | ප්‍රක්ෂේපිත ඉතුරුම් අරමුදල | | |
|---|---|---|---|
| | 4% වාර්ෂික (p.a.) | 8% වාර්ෂික (p.a.) | 12% වාර්ෂික (p.a.) |
| 100,000 | 2,452,251 | 3,267,483 | 4,409,409 |
| 200,000 | 4,935,374 | 6,575,450 | 8,872,728 |

ශ්‍රී.ල.රු

ඉහත ප්‍රක්ෂේපිත වටිනාකම් හුදෙක් නිදර්ශනයක් වන අතර අදාළ වටිනාකම් ගණනය කර ඇත්තේ සැලසුමේ උද්ධමන ආරක්ෂණ ප්‍රතිශතය 5%ක් බවත්, ජීවිතාවරණය පළමු වාර්ෂික මූලික වාරිකය මෙන් දෙගුණයක් බවත්, අදාළ වාරිකයන් Aggressive ආයෝජන ක්‍රමවේදය තුළ ආයෝජනය කරන ලද බවටත් උපකල්පනය කරමිනි.

ඒ ඒ අරමුදලේ ක්‍රියාකාරීත්වය හා ඒ ඒ අරමුදලට අදාළ ගාස්තු මත කල්පිරීමේ වටිනාකම රඳා පවතී.

මෙහි දක්වා ඇති ඉපැයීම් අනුපාතයන් සහතික නොකෙරේ. එමෙන්ම මෙම අනුපාතයන් ඔබට ලැබිය හැකි ඉහළම හෝ පහළම අනුපාතයන් ද නොවේ.

කල්පිරීමේදී ඔබට ලැබෙනුයේ ඔබේ අරමුදලෙහි වටිනාකම වේ. කල්පිරීමේදී ජීවිතාවරණය අවසන් වුවද, කල්පිරීමේ දිනයෙන් පසුවද ඉතුරුම් අරමුදල පවත්වාගෙන යාමේ හැකියාව ඔබට ඇත.

# ඔබගේ ඉතුරුම් සැලසුම යටතේ හිමිවන නම්‍යශීලීත්වයන්

## උද්ධමන ආරක්ෂණය

උද්ධමන ආරක්ෂණය, ඔබගේ ඉතුරුම් අරමුදලේ වටිනාකම උද්ධමනයේ අහිතකර බලපෑමෙන් සුරක්ෂිත කරනු පිණිස සකසා ඇත.

සැලසුම ආරම්භයේදී උද්ධමන ආරක්ෂණය 5%ක් වේ. එමගින්, ඔබගේ වාර්ෂික මූලික වාරිකය සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභයේ වාරිකය (තෝරාගෙන ඇත්නම්) සෑම වසරක් පාසාම 5% කින් ඉහළ යන බවට අදහස් කෙරේ.

දෙවන සැලසුම් වසරේ සිට උද්ධමන ආරක්ෂණ ප්‍රතිශතය 5%ක මට්ටමේ පවත්වා ගෙනයාමේ හෝ ඊළඟ සැලසුම් සංවත්සරයේ සිට බලපැවැත්වෙන පරිදි, වාර්ෂික ප්‍රතිශතය 0%, 10% හෝ 15% ක් වශයෙන් වෙනස් කිරීමේ අවස්ථාවද ඔබ වෙත හිමිවේ.

## අමතර වාරික (Top-ups)

වාරික ගෙවීමේ කාලසීමාව තුළ සැලසුමේ නියමිත වාරිකවලට අමතරව, 'අමතර වාරික' ගෙවමින් ඔබගේ ඉතුරුම් අරමුදල වැඩි කරගැනීමේ අවස්ථාව ඔබට හිමිවේ. 'අමතර වාරික' ඕනෑම විටකදී ගෙවිය හැකි වන අතර එක් 'අමතර වාරිකයක' වටිනාකම රුපියල් 60,000 කට නොඅඩු විය යුතුය.

# ඔබටම ගැළපෙන ජීවිතාවරණයක්

AIA SavingsPlan මගින් ඔබගේ පළමු වාර්ෂික මූලික වාරිකයෙන් 2-15 ගුණයක් දක්වා ජීවිතාවරණයක් ලබාගත හැක. එයට අමතරව සුළු මුදලක් ගෙවා අවශ්‍යනම්, ඔබගේ ජීවිතාවරණය තවදුරටත් වැඩි කර ගැනීමේ අවස්ථාවද ඔබට හිමිවේ.

# අනපේක්ෂිත වියෝවකදී...

අනපේක්ෂිත වියෝවකදී ඔබගේ ආදරණීයයන් වෙත ජීවිතාවරණය හෝ අරමුදලේ වටිනාකම යන දෙකෙන් ඉහළ අගය සමග තෝරාගත් අදාළ අමතර රක්ෂණාවරණ ප්‍රතිලාභද ලැබෙනු ඇත.

# සැලසුමට සම්බන්ධ අනෙකුත් තොරතුරු

- ඇතුළත්වීමේ වයස: අවුරුදු 18-60 දක්වා. කල්පිරීමේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය
- සැලසුම් කාලසීමාව: අවුරුදු 10-30
- මූලික වාරිකයෙන් ආයෝජනය සඳහා වෙන් කෙරෙන ප්‍රතිශතය

| සැලසුම් වසර | 1වන | 2වන | 3වන | 4වන සහ 5වන | 6 සිට |
|---|---|---|---|---|---|
| වෙන්කරන ප්‍රතිශතය | 45% | 75% | 85% | 95% | 99% |

- ඔබගේ වාරිකය මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව හෝ වාර්ෂිකව ගෙවිය හැක.

# සැලසුම බලරහිත වුවහොත් සිදුවන්නේ කුමක්ද?

පළමු සැලසුම් වසර තුන ඇතුළත ඔබ විසින් ඔබගේ වාරික දින 30ක සහන කාලසීමාව තුළ නියමිත පරිදි ගෙවනු නොලැබූ විටකදී, සැලසුම බලරහිත වන අතර ඔබ වෙත කිසිදු ප්‍රතිලාභයක් හිමිනොවනු ඇත. කෙසේවුවද කොන්දේසිවලට යටත්ව සැලසුම නැවත බලගැන්වීමේ අවස්ථාව ඔබට හිමිවේ.

ඔබ විසින් වසර තුනක් හෝ එයට වැඩි කාලයක් වාරික නිසි පරිදි ගෙවමින් සැලසුම පවත්වාගෙන ගොස් ඇත්නම්, අත්‍යවශ්‍ය අවස්ථාවකදී සැලසුම මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව ඔබට හිමිවේ. කෙසේ වුවද මෙහිදී සැලසුම සැලකිය යුතු පවාරණ ගාස්තුවකට යටත්වන අතර, එම ගාස්තු සැලසුම පවත්වාගෙන ගොස් ඇති කාලසීමාව අනුව වෙනස් වේ.

විකල්පයක් වශයෙන් ජීවිතාවරණ ප්‍රතිලාභ රහිතව ඔබේ අරමුදල වර්ධනය වීමට ඉඩහරිමින් කල්පිරීමේ වටිනාකමක් ලබා ගැනීමටද ඔබට හැකි වේ.

# SavingsPlan සඳහා වන අමතර ප්‍රතිලාභ

## අතිරේක ජීවිත රක්ෂණ ප්‍රතිලාභය

සුළු මුදලක් ගෙවීමෙන් මූලික ජීවිතාවරණය වැඩිකර ගතහැකියි. මෙයින් ඔබේ පවුලේ සුරක්ෂිතභාවය වඩාත් තහවුරු වේ.

## හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවකදි ඔබේ යැපෙන්නන්හට මෙයින් වැඩි රැකවරණයක් හිමිවේ. එයට අමතරව ඔබට පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණය මෙයින් සැලසෙනු ඇත (සැලසෙන මූල්‍ය ප්‍රතිලාභයේ වටිනාකම අකර්මණ්‍යතාවයේ ස්වභාවය මත රඳා පවතී).

## රෝහල් ගතවීමේ ප්‍රතිලාභය

ඔබ දින තුනකට වඩා රෝහල් ගතව සිටියේනම්, සෑම දිනකටම (ඇතුළත් කළ දිනයේ සිටම) රු. 10,000ක උපරිමයක් දක්වා මුදල් ලබාදෙයි. දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කළහොත් ලැබෙන එම මුදල දෙගුණවේ. මෙම ප්‍රතිලාභය ඔබේ කලත්‍රයා හා දරුවන් වෙනුවෙන්ද ලබාගත හැක.

## වැඩිහිටි සැත්කම් ප්‍රතිලාභය

ඔබ හා ඔබේ කලත්‍රයා වෙත ශ්‍රී ලංකාවේදී ඉන්දියාවේදී හෝ සිංගප්පූරුවේදී ලැයිස්තුගත සැත්කම් 250ක් සිදුකිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමි වේ.

## බරපතල රෝග ආවරණය

බරපතල රෝගාබාධ 22 කදී ඔබට හා ඔබගේ කලත්‍රයාට මූල්‍යමය ආධාර ලබාදෙයි. රුපියල් මිලියන 3ක උපරිමයක් දක්වා වූ ආවරණයක් ඔබට තෝරාගත හැකියි.

## වාරික ආරක්ෂණ ප්‍රතිලාභය

පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකට පත්වුවහොත්, ඉතිරි වාර මුදල් තැන්පත් කිරීමේ වගකීමෙන් ඔබ නිදහස්. එහෙත් පොරොන්දු වූ ප්‍රතිලාභ ඒ අයුරින්ම දිගටම ක්‍රියාත්මකයි.

## ආදායම් ආරක්ෂණ ප්‍රතිලාභය

අනපේක්ෂිත අයුරින් ඔබගේ වියෝවකදී හෝ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී ඔබේ යැපෙන්නන්හට වාරික ගෙවීමේ කාලසීමාව තුළදී වසර 10ක උපරිමයකට යටත්ව මාසික ආදායමක් හිමිවේ.

## කලත්‍ර ජීවිත ආවරණය

ඔබගේ කලත්‍රයාට ජීවිත රැකවරණයක් ඔබේ සැලසුම තුළින්.

## ළමා සෞඛ්‍යාරක්ෂණ ප්‍රතිලාභය

ඔබේ දරුවාට ශ්‍රී ලංකාවේදී, ඉන්දියාවේදී හෝ සිංගප්පූරුවේදී ලැයිස්තුගත සැත්කම් 250ක් සිදුකිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමිවේ. එයට අමතරව එමගින් රෝහල් ගතවීම සඳහා මුදල් ද වයස අවුරුදු 12ට අඩු දරුවකු සමග දෙමව්පියන්ගෙන් අයෙකුට නැවතීමට සිදුවුවහොත් ඒ සඳහා විශේෂ දීමනාවක්ද පිරිනැමේ.

රක්ෂිතයා, රක්ෂණාවරහිමියා නොවන අවස්ථාවකදී මෙම රක්ෂණ සැලසුමේ ප්‍රතිලාභ රක්ෂණාවරහිමියාට අදාළ වන අතර, ආවරණයන් රක්ෂිතයා සඳහා අදාළ වේ.

මෙම පත්‍රිකාව රක්ෂණාවරය පිළිබඳ සංක්ෂිප්තයකි. මෙම සැලසුම සම්බන්ධ සම්පූර්ණ විස්තර සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න.

අරමුදල් සඳහා ආයෝජන ප්‍රතිලාභ සහ/හෝ මෙම රක්ෂණාවරයේ ඉතිරිකිරීමේ ප්‍රතිලාභ සමාගම විසින් සහතික නොකෙරෙන අතර එම අරමුදල් සඳහා වන ආයෝජන ප්‍රතිලාභ සහ/හෝ ඉතිරිකිරීමේ ප්‍රතිලාභ ආයෝජන අවදානමට (ආයෝජනයට පාත්‍ර වන වත්කම් වල සිදුවන මිල උච්චාවචනයන්ට අනුකූලව) යටත්වන අතර එම ආයෝජන අවදානම් ඔප්පුහිමියා විසින් දැරියයුතු වේ.

SP - 300000184
V4 - 05/18

# AIA සමූහය පිළිබඳ

AIA සමූහය ආසියා ශාන්තිකර කලාපයෙහි විශිෂ්ටතම ජීවිත රක්‍ෂණ සේවා සම්පාදකයා වේ.



1919
චීනය

1931
හොංකොං

1931
සිංගප්පූරුව

1938
තායිලන්තය

1947
පිලිපීනය

1948
මැලේසියාව

1957
බෲනායි

1972
ඕස්ට්‍රේලියාව

1981
නවසීලන්තය

1982
මැකාවු

1984
ඉන්දුනීසියාව

1987
කොරියාව

1990
තායිවානය

2000
වියට්නාමය

2001
ඉන්දියාව

2012
ශ්‍රී ලංකාව

2013
මියන්මාරය *

2015
කාම්බෝජය

* මියන්මාරයේ ඇත්තේ AIA නියෝජිත කාර්යාලයකි.

**US$ ට්‍රිලියන 1 කට** වැඩි සමස්ත මූලික රක්ෂිත මුදලක්

ආසියාවේ **වසර 100 කට ආසන්න** සාඩම්බර ඉතිහාසයක්

**වෙළඳපළ 18 ක මෙහෙයුම්**

**මිලියන 30 කට** අධික තනි පුද්ගල රක්ෂණාවර

**මිලියන 16 කට** අධික සමූහ සැලසුම් සාමාජිකයින්

AIA Insurance Lanka PLC (Co.No.PQ 18) විසින් නිකුත් කරන ලදී. 05/2018

HEALTHIER, LONGER, BETTER LIVES

**AIA ඉන්ෂුවරන්ස් ලංකා PLC**
(Co.No.PQ 18)
AIA ටවර්, 92, ධර්මපාල මාවත, කොළඹ 07
ක්‍ෂණික ඇමතුම්: 011 2310310
ෆැක්ස්: 011 4715892
ඊ-මේල්: lk.info@aia.com